**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 06/95**

මගේ අංකය: I/543ඊ/02ඩී/02/94(II)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07
**1995.02.23** දින දිය

සියලුම ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

**1994-09-09 දින දරණ වැටුප් විෂමතා හා සංශෝධන**
**<u>කමිටු වාර්තාව - අන්තර් දීමනාව</u>**

ඔබගේ අවධානය 1994.08.12 දින අංක 33/94 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය කෙරෙහි යොමු කරනු ලැබේ.

02. රජය විසින් 1994.08.12 දින අංක 33/94 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සේවා කිහිපයකට පමණක් ලබාදෙන ලද විශ්‍රාම වැටුපට ගණන් නොගැනෙන අන්තර් දීමනාව සම්බන්ධයෙන් පහත දැක්වෙන තීරණ ගෙන තිබේ.

(I) ඉංජිනේරු, පශුවෛද්‍ය, කෘෂිකර්ම ආදී සේවාවන්ට ලබාදෙන ලද අන්තර් දීමනා, එම සේවාවල නිලධාරීන්ට වැටුප් හා සේවක සංඛ්‍යා කමිටුව විසින් වැටුප් පිළිබඳ සමාලෝචනයක් කරනතුරු දිගටම ලබාදීම.
(II) එම අන්තර් දීමනාව පහත දැක්වෙන සේවාවල නිලධාරීන්ටද 1994 ජූලි මස 01 දින සිට ක්‍රියාත්මක වන සේ එම පදනම මතම ලබාදීම.

(අ) කැබිනට් අමාත්‍යාංශවල ලේකම්වරුන් සහ අතිරේක ලේකම් වරුන් - මාසයකට රුපියල් 2000/- අන්තර් දීමනාවක්
(ආ) ශ්‍රී ලංකා පරිපාලන සේවය
(ඇ) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය
(ඈ) ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය
(ඉ) ශ්‍රී ලංකා සැලසුම් සේවය
(ඊ) වෛද්‍ය සේවය (විශේෂඥ හා විශේෂඥ නොවන)
(උ) ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය
(ඌ) වැටුප් හා සේවක සංඛ්‍යා කමිටුව විසින් එක් එක් කාරණය වෙන වෙනම සලකා බලා හඳුණාගනු ලබන වෙනත් සමාන්තර කළමනාකාර සේවාවන්

03. ඉහත (ආ) සිට (උ) දක්වා වූ සේවාවනට අන්තර් දීමනාව ගෙවනු ලබන්නේ පහත සඳහන් පරිදි ය.

| | |
|---|---|
| II පන්තිය II ශ්‍රේණිය | මසකට රුපියල් 1600/- |
| II පන්තිය I ශ්‍රේණිය | මසකට රුපියල් 1750/- |
| I පන්තිය | මසකට රුපියල් 2000/- |

04. ඉහත (ඌ) අක්ෂරයෙන් දක්වා ඇති සේවාවන්ට ගෙවීම් කරන ආකාරය වැටුප් හා සේවක සංඛ්‍යා කමිටුව විසින් තීරණය කරනු ඇත.

05. මෙම සේවාවල තනතුරු දරමින් සිට විශ්‍රාම ගොස් නැවත එම තනතුරුවලම සේවයේ යොදවා ඇති නිලධාරීනටද ඔවුන් එම තනතුරු දරණතාක් මෙම දීමනාව ගෙවිය හැකිය.

06. කරුණාකර මේ අනුව කටයුතු කරන්න.

අ.කලේ/(**ආර්.එස්.ජයරත්න**)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
වැවිලි කර්මාන්ත හා පාර්ලිමේන්තු
කටයුතු අමාත්‍යාංශය